**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපචිත වියදම් රු.265,981ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ස්ථාවර වත්කම් යටතට ගැනෙන රු.764,520ක වියදම් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | ගිණුම් විෂයයන් 06ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂ අතර රු.85,709,469ක වෙනසක් විය. | 2024 අවසන් ගිණුමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08ක පැවැති රු.163,610,295ක් වෙනුවෙන් උපලේඛන හා මූලාශ්‍ර ලියවිලි නොතිබුණු අතර තැන්පත් ගිණුම්වල පවතින රු.8,842,547ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.. | ස්ථාවර වත්කම් පරීක්ෂා කර ලේඛනගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන අතර 2024 ගිණුම් පිළියෙල කිරීමේදී තැන්පතු ගිණුමේ ශේෂ නිරවුල් කරමි. | තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) අනුව, 1995 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලය තුළ අවස්ථා 41ක දී ලබා දී තිබුණු රු.1,902,321ක අත්තිකාරම් පියවා නොතිබුණි. | - 1993 වර්ෂයේ සිට 2009 වර්ෂය තෙක් නොපියවා ඇති අත්තිකාරම් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට හා 2010 වර්ෂයේ සිට 2019 දක්වා වූ අත්තිකාරම් පියවා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතියි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,583,957ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,070,807ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,029,000 | 9,479,891 | 11,816,631 | 24,400,450 | 8,561,500 | 10,595,823 | 8,778,931 | 26,327,278 |
| කුලී | 11,652,500 | 12,285,671 | 12,088,896 | 1,313,907 | 12,107,800 | 11,873,166 | 11,742,288 | 1,282,271 |
| බලපත්‍ර ගාස්තු | 1,257,600 | 936,780 | 936,780 | 1,000 | 1,072,600 | 725,135 | 723,885 | 5,250 |
| වෙනත් ආදායම් | 9,926,100 | 11,043,888 | 9,332,714 | 3,258,189 | 7,378,300 | 7,233,149 | 6,248,096 | 1,961,071 |
| | 32,865,200 | 33,746,230 | 34,175,021 | 28,973,546 | 29,120,200 | 30,427,273 | 27,493,200 | 29,575,870 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.23,616,980ක් වූ හිඟ වරිපනම් හා අක්කර බදු ශේෂය තුළ වසර 05ට වඩා පැරණි රු.16,903,961ක ශේෂයක් විය. | ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. | හිඟ ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. |
| (ආ) | වර්ෂ 01ත් 03ත් අතර කාලයක් හිඟහිටි කඩකුලී, සතිපොළ හා පදික වෙළඳාම් ගාස්තු රු.1,111,393ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමි. | - එම - |
| (ඇ) | අධිකරණ තීන්දුවකට අනුව ඇහැලියගොඩ සතිපොළෙන් 2012 වර්ෂය වෙනුවෙන් හිඟහිටි බදු කුලී, 2016 අප්‍රේල් වනවිට ගෙවා නිමකළ යුතු වුවද, රු.180,000ක් තවදුරටත් අය වීමට පැවැතිණි. එහෙත්, මේ සම්බන්ධයෙන් අධිකරණය දැනුවත් කර නොතිබුණි. | මේ සඳහා අවිස්සාවේල්ල දිසා අධිකරණයෙහි නීතිමය කටයුතු ආරම්භ කර ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දුරකථන කුළුණු 14කින් වර්ෂ 2004 - 2021 කාලය සඳහා ව්‍යාපාර බදු අය නොකිරීම නිසා රු.525,000ක ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේ දී ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ පනවාගත යුතු අතුරු ව්‍යවස්ථා 30න් 28ක්ම පනවා ගෙන නොතිබුණි. | ඒ සඳහා කටයුතු කරමින් පවතී. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතු වේ. |

**3.2 පාරිසරික ගැටළු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බල ප්‍රදේශයේ ජල මූලාශ්‍ර 21ක ජලය පරිභෝජනය සඳහා නුසුදුසු බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් දන්වා තිබුණ ද, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නුසුදුසු බව පෙන්වා දුන් ස්ථාන සඳහා ක්ලෝරීන් යෙදීමට උපදෙස් දී ඇත. | ජල මූලාශ්‍ර පිරිසිදු කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | ඇහැලියගොඩ පොළ භූමියේ වූ වැසිකිළියේ පූතික ටැංකිය 2019 වර්ෂයේ රු.375,000කට කළ අලුත්වැඩියාව නිසි පරිදි ඉටු නොකිරීම නිසා 2023 වර්ෂයේදී රු.171,393කට නැවත අලුත්වැඩියා කිරීමට සිදු වී තිබුණි. එමෙන්ම, 2013 හා 2014 වර්ෂවල දී ලද ගලි බවුසර් 02ක් ලද දිනයේ සිට අභාවිතව දිරාපත් වෙමින් පැවතියදී, 2022 හා 2023 වර්ෂවල දී රු.148,000ක් වැයකර පෞද්ගලික ගලි රථයක සේවය ලබා ගෙන තිබුණි. | මළ ද්‍රව්‍ය කුලී රථයක් මඟින් ඉවත් කිරීමට සිදුවිය. වර්තමානය වනවිට ගබඩා ටැංකියට මළ ද්‍රව්‍ය ගලා යන නල පද්ධතිය අළුත්වැඩියා කර ඇත. | අලුත්වැඩියා හා නඩත්තු සිදුකළ යුතු අතර සභාව සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ඉදි කළ තාප්පයක් හා ගේට්ටුවක් සභාපතිවරයාගේ තීරණය මත ඉවත් කිරීම නිසා රු.252,631ක නිෂ්ඵල වියදමක් ඇති වී තිබුණි. | මෙය මහ සභාවේ තීරණය පරිදි සිදු කෙරුණි. ඒ සඳහා ගේට්ටුව හා බැම්මේ කොටසක් ඉවත් කරන ලදී. | සංවර්ධන කටයුතු ඵලදායී ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාපතිවරයා විසින් රැගෙන ගිය සභාව සතු කැබ් රථයක් 2022 වර්ෂයේදී අනතුරට පත්ව තිබුණි. ඒ සඳහා වූ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව, එය රාජකාරී කටයුත්තක් ද යන්න තහවුරු කරගත නොහැකි වූ බව දක්වා තිබුණි. සභාපතිවරයා ප්‍රකාශ ලබා ගැනීම සඳහා සහභාගී වී නොතිබුණි. | සභාපතිතුමාගෙන් කරුණු විමසීමේ දී ඒ පිළිබඳ කිසිවක් මතක නැති බව ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |